# මහ බැංකු ගිණුම් හා ගණුදෙනු

1966 වසරේ මහ බැංකුවේ මුදල් පිළිබඳ ගිණුම් II වැනි පරිශිෂ්ඨයේ 6 වැනි සංඛ්‍යා සටහනෙහි දැක්වේ. 1965 වසර හා සැසැඳීමේදී දක්නට ලැබුණු ප්‍රධාන වෙනස්කම් පහත දැක්වේ.

| | වෙනස | |
|---|---|---|
| | රුපියල් දශ ලක්ෂ | සියයට ගණන |
| මුළු ඉල්ලුම් වගකීම් ... ... ... ... | + 105·8 | + 7·4 |
| සංසරණයෙහි පවත්නා මුදල් ... ... ... ... | — 9·1 | — 0·9 |
| ඉල්ලුම් තැන්පතු ... ... ... ... | + 114·8 | + 27·3 |
| (මෙයින් වෙළෙඳ බැංකුවල) ... ... ... | — 50·4 | — 36·0 |
| ජාත්‍යන්තර සංචිතය ... ... ... ... | — 139·1 | — 49·3 |
| දේශීය වත්කම් ... ... ... ... | + 218·7 | + 16·2 |
| රජයේ හා රජය ඇපවූ සුරැකුම්පත් ... ... ... | + 155·9 | + 14·1 |

\+ වැඩිවීම
— අඩුවීම

රන් පවුම් හා එ. ජ. ඩොලර් සඳහා මහ බැංකු අනුපාතිකයන් හි වෙනසක් වර්ෂය තුළ දී ඇති නොවිණි. එකී අනුපාතිකයන් පහත දැක්වේ :—

| | | විදුලි පුවත් මගින් මිලට ගැනීම් | විදුලි පුවත් මගින් විකිණීම් |
|---|---|---|---|
| රන්පවුම් | එතැන් | සි: 1 පැ: 6 3/64 | සි: 1 පැ: 6 1/32 |
| (ලංකා රුපියලකට) | ඉදිරි (සමස තෙක්) | එතැන් සඳහා මසක වට්ටම පැ : 1/128 | එතැන් සඳහා මසක අධිමිල පැ : 1/128 |
| එ. ජ. ඩොලර් | එතැන් | රු : 477·00 | රු : 477·25 |
| (සියයකට) | ඉදිරි (සමස තෙක්) | රු : 477·00 | එතැන් සඳහා මසක අධිමිල සත 25 යි. |

1966 ජුනි මස 6 වැනි දින ඉන්දියානු රුපියලෙහි අගය පහළ හෙළීමෙහි ප්‍රතිඵලයක් වශයෙන්, ඉන්දියානු රුපියල් සඳහා මහ බැංකු විනිමය අනුපාතිකය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබීය :—

| | | විදුලි පුවත් මගින් මිලට ගැනීම් | විදුලි පුවත් මගින් විකිණීම් |
|---|---|---|---|
| ඉන්දියානු රුපියල් | එතැන් | රු : 63 5/16 | රු : 63 3/8 |
| (සියයකට) | ඉදිරි (සමස තෙක්) | එතැන් සඳහා මසක වට්ටම රු : 1/32 | එතැන් සඳහා මසක අධිමිල රු : 1/32 |

මහ බැංකුවේ විදේශීය විනිමය ගනුදෙනු, II වැනි පරිශිෂ්ඨයේ 11 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

ඇතැම් නියමිත ගනුදෙනු නිසා උද්ගත වන රජයේ සුරකුම්පත් හා භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබා දෙන අත්තිකාරම් සඳහා වන, මහ බැංකු පොළී අනුපාතිකය සියයට 5 හි නොවෙනස්ව පැවතිණි. මෙරට වගා කරන කෘෂිකාර්මික නිෂ්පාදිත මිලට ගැනීම, විකිණීම හා ගබඩා කිරීම නිසා උද්ගත වන, සමුපකාර සමාගම්වල භාවිතීය පොරොන්දු නෝට්ටු ඇපයට තබා දෙන අත්තිකාරම් සඳහා වන මහ බැංකු පොළී අනුපාතිකය ද සියයට 3 හි නොවෙනස්ව පැවතිණි. භාණ්ඩාගාර බිල්පත් සඳහා මහ බැංකුවේ වට්ටම් අනුපාතිකය, අවසන්වරට පිළිගත් ටෙන්ඩර් අනුපාතික සාමාන්‍යයෙන් සියයට 1/8ට තව දුරටත් නියම කැරිණි. ණය දෙන ආයතන වලට දෙන මුදල්, නැවත ගෙවීම සඳහා වූ ණය වෙනුවෙන් මහ බැංකුවේ පොළී අනුපාතිකයන් පහත දැක්වේ :—

| | |
|---|---|
| කර්මාන්ත හෝ කෘෂිකර්මාන්ත වැඩි දියුණු කිරීම හෝ සංවර්ධනය සඳහා ...... | වර්ෂයකට 3% (එහෙත් එසේ වනුයේ මෙම පහසුකමෙන් ප්‍රයෝජන ලබන ණය දෙන ආයතන වර්‍ෂයකට 6% කට වඩා අය නොකරන්නේ නම් පමණෙකි). |
| වෙළෙඳාම, වාණිජ කර්මාන්ත හා වෙළෙඳ ව්‍යාපාර වැඩි දියුණු කිරීම හෝ සංවර්ධනය සඳහා ...... | වර්‍ෂයකට 5% |
| තේ නිෂපාදනය සඳහා අවශ්‍ය යන්ත්‍රෝප කරණ මිලයට ගැනීම හා නව තේ කර් මාන්ත ශාලා ගොඩනැගීම සඳහා තේ පාලක විසින් පොළියෙන් භාගයක් ගෙවනු ලබන විටදී. ...... | වර්‍ෂයකට 5% (එහෙත් එසේ වනුයේ මෙම පහසුකමෙන් ප්‍රයෝජන ලබන ආයතන වර්‍ෂයකට 8% කට වඩා අය නොකරන් නේ නම් පමණෙකි). |

**මුදල් නිකුතුව**

1966 වර්ෂය තුළදී අළුත් මෝස්තරයේ රුපියල් 2/- සහ රුපියල් 5/- වර්ගවල නෝට්ටු නිකුත් කරන ලදී. රුපියල් 2/- කේ නෝට්ටුව මාර්තු මාසයේදී ත් රුපියල් 5/- හේ නෝට්ටුව දෙසැම්බර් මාසයේදීත් නිකුත් කැරිණි. රුපියල් 2/- නෝට්ටුවේ ඉදිරිපස ප්‍රධාන වශයෙන් දුඹුරු පැහැයෙන් යුක්ත වන අතර, එය නෝට්ටුවේ මැද සිට යට වාටිය තෙක් පැතිරී ගිය විවිධ පැහැ යෙන් යුත් සංකීර්ණ මෝස්තරයක් මත මුද්‍රණය කොට ඇත. මහා පරාක්‍රමබාහු රජ තුමාගේ යයි පුරාවෘත්තානුකූලව සැලකෙන, පොළොන්නරුවේ තිබෙන ප්‍රතිමාවෙහි පිළිරුව නෝට්ටුවේ දකුණු අත පැත්තේ පනේලයක දිස්වන අතර, වම් පැත්තේ පනේලයක ලංකා සිංහලාංජන දිය ලකුණ වෙයි. නෝට්ටුවේ ප්‍රමාණය $4\frac{1}{2}$'' × 2 5/16 '' වෙයි. නෝට්ටුවේ දකුණු අත පැත් තේ සිරස් අතට ලෝහමය නූලක් ඇතුළු කොට ඇත. නෝට්ටුවේ පසු පස ප්‍රධාන වශයෙන් දුඹුරු පැහැයෙන් යුක්ත වන අතර එය මත මැදිරිගිරියේ වටදගෙයි පිළිරුව දැක්වෙයි. දකුණු පස පනේලය ඒ ඒ ප්‍රමාණයෙන් යුත් කුඩා අකුරු වලින් පිරී ඇත. මෙම අකුරු නෝට්ටුවේ උඩ කෙළෙවර දිගේ ද විහිදී ගොස් ඇත.

රුපියල් 5/- හේ නෝට්ටුවේ ඉදිරිපස ප්‍රධාන වශයෙන් රතු සහ දුඹුරු පාටින් වන අතර, එය නෝට්ටුවේ මැද සිට යට වාටිය තෙක් පැතිරී ගිය සංකීර්ණ විවිධ පාටින් යුත් මෝස්තරයක් මත මුද්‍රණය කොට ඇත. මහා පරාක්‍රමබාහු රජ තුමාගේ යයි පුරාවෘත්තානුකූලව සැලකෙන, පොළොන්නරුවේ තිබෙන ප්‍රතිමාවෙහි පිළිරුව නෝට්ටුවේ දකුණු පැත්තේ පනේලයක දිස්වන අතර, වම් පැත්තේ ලංකා සිංහලාංජන දිය ලකුණ වෙයි. නෝට්ටුවේ ප්‍රමාණය 4 15/16'' × $2\frac{1}{2}$'' වෙයි. දකුණු පස සිරස් අතට ලෝහමය නූලක් ඇතුළු කොට තිබේ. නෝට්ටුවේ පසු පස,

පොළොන්නරුවේ රාජ සභා මණ්ඩපයෙහි, නිශ්ශංක මල්ල රජ තුමාගේ සිංහාසනයට රුකුල් දුන් සෙල්මුවා සිංහ රූපයෙහි පිළිරුව වන අතර, එහි මැද පනේලයද රතු පැහැයෙන් මුද්‍රණය වී ඇත. දෙපසෙහි පනේල ඒ ඒ ප්‍රමාණයෙන් යුත් කුඩා අකුරුවලින් පුරවා ඇත.

මෙකී අළුත් මෝස්තරයේ නෝට්ටු ද, මෙයට කලින් නිකුත් කරන ලද, තවමත් නීතියෙන් වලංගු නෝට්ටු සමග සංසරණයෙහි පවතියි.

**ආදායම් හා වියදම්.**

මේ වර්ෂයේ මහ බැංකුවේ ආදායම රු : 2,09,04,377 ක් විය. වසරේ මහ බැංකුවේ වියදම, බැංකු ගොඩනැගිල්ලෙහි වටිනාකමෙහි ක්ෂයවීම් සඳහා වූ ප්‍රතිපාදනය ද ඇතුළුව, රුපියල් 1,85,35,359 ක් විය. රු : 23,69,018 ක් වූ ශුද්ධ ලාභය, මුදල් නීති පනතේ 39 (අ) ඡෙදය ප්‍රකාර, පනතේ 40 වැනි ඡෙදය යටතේ 1965 වර්ෂය තුළදී ඇති කරන ලද මුදල් ගැලපුම් ගිණුම් අඩු කිරීම් සඳහා යොදවන ලදී. මේ ගිණුමෙහි ශේෂය දැනට රු : 1,06,263 ක් ව පවතී.

**බැංකු පරිපාලනය**

1966 වර්ෂයේදී, මුදල් නීති පනතේ 29 (1) වගන්තිය යටතේ බැංකු පරිපාලන දෙපාර්ත මේන්තුව විසින් වෙළෙඳ බැංකු හයක් පරීක්ෂා කරන ලදී. 1961 අංක 65 දරන මුදල් පනතේ, බැංකු ගිණුම් ඇරඹීම හා සම්බන්ධිත III වැනි කොටස ක්‍රියාත්මක කිරීමේ කටයුතු තවදුරටත් දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබීය.

1965 දෙසැම්බර් 22 වැනි දින මුදල් මණ්ඩලය විසින් එළඹ ගත් තීරණය ප්‍රකාර, බැංකු පරි පාලන දෙපාර්තමේන්තුවේ අංශයක් වශයෙන් ඇති කරන ලද සංවර්ධන මුදල් අංශය විසින් 1966 වසරේදී යෝජනා ක්‍රම අගැයීම පිළිබඳව නිලධාරීන් පුහුණු කිරීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කරන ලදී. මෙම වැඩ පිළිවෙළ පුළුල් කිරීමක් වශයෙන් පුහුණුව සඳහා නිලධාරීන් දෙදෙනෙකු පිටරට යවන ලදී. මෙම නිලධාරීන්ගෙන් එක් අයෙකු කැනඩාවේ දී සහ එක්සත් ජනපදයේ දී ද අනෙක් අය ජපානයේ දීද පුහුණුව ලැබූහ. කර්මාන්ත සංවර්ධනය සඳහා වූ එක්සත් ජාතීන්ගේ මධ්‍යස්ථානය සහ ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් ඒකාබද්ධව සංවිධානය කරන ලද යෝජනා ක්‍රම සැකැසීමේ සහ අගැයීමේ කාර්යායතනයට සහභාගිවීම සඳහා එකී අංශයේ ප්‍රධානයා සහ තවත් මහ බැංකුවේ නිලධාරියෙකු නම් කරන ලදී. දැන් මෙම අංශය මෙකී විශේෂ ක්ෂෙත්‍රයෙහි පුහුණුවක් ලැබූ නිලධාරීන්ගෙන් සැදී ඇති අතර, සංවර් ධන යෝජනා ක්‍රම අගැයීමේ කාර්යයෙහි ලා ඔවුන්ගේ සේවාවන් ලබාගත හැකිය.